# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON -E1025

එංගලන්තයේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි          කාලය : පැය 03 යි

---

### 1 කොටස - එංගලන්ත ආර්ථික ඉතිහාසය

01. එංගලන්තයේ ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරයන් හි ආර්ථික සහ සාමාජික ප්‍රතිවිපාක පිරික්සන්න.

02. 1760-1830 දක්වා එංගලන්තයේ කාර්මික ශිල්පීය ක්‍රමවල වර්ධනයට අදාළ සංසිද්ධීන්වලට කාර්මික විප්ලවය යන ව්‍යවහාරය යෙදීමේ යෝග්‍යතාව අගයන්න.

03. එංගලන්තයේ දුම්රිය ප්‍රවාහන සේවයේ වර්ධනයට දෙවන කාර්මික විප්ලවය යයි පැවසීම මුලින්ම කෙතරම් යෝග්‍යදැයි විමසන්න.

04. බ්‍රිතාන්‍ය වෘත්තීය සමිති ව්‍යාපාරයේ පැහැදිලි යුග බෙදීමක් දැකිය හැක්කේ කවර හේතූන් නිසා දැයි විමසන්න.

05. 1815 ධාන්‍ය නීතිවල වලංගුතාව පිළිබඳව ඉදිරිපත් වූ තර්ක මොනවාදැයි විස්තර කරන්න.

### 11 කොටස - ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය

06. ශ්‍රී ලංකාවේ රාජකාරි ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය විස්තර කොට එය අවලංගු කිරීමෙන් උද්ගත වූ ප්‍රතිවිපාක විමසන්න.

07. කෝපි වගාවේ වර්ධනයට අවශ්‍ය නිෂ්පාදන සාධක සැපයීමේ දී අධිරාජ්‍යවාදීන් ගත් ක්‍රියාමාර්ගවල දීර්ඝකාලීන ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

08. 1948 දක්වා ශ්‍රී ලංකාවේ යැපුම් කෘෂිකර්මය සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අනුගමනය කළ ප්‍රතිපත්තිය අගයන්න.

09. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ ආරම්භය සහ වර්ධනය සිදු වූ ආකාරය විස්තර කරන්න.

10. පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳ සටහන් ලියන්න.

(අ) කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
(ආ) මුඩුබිම් පණත්
(ඉ) ශ්‍රී ලංකාවේ සින්කෝනා වගාව
(ඊ) 1935 ඉඩම් සංවර්ධන ආඥාපණත
(උ) බ්‍රිතාන්‍ය පාලනය යටතේ ප්‍රවාහන දියුණුව

*************************